# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

1976 දෙසැම්බර් මස 17 වන දින

II වන කොටස

## අතිරේකය

(76. 12. 31 දින නිකුත් කරන ලදී.)

# ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන)

1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

ප්‍රවෘත්ති සහ ගුවන් විදුලි අමාත්‍යවරයාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

## ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන)

එල්.ඩී.—ඕ. 8/76

**1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක     දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ, "ලංකා" යන වචනය සඳහන් වන සෑම අවස්ථාවක දී ම "ශ්‍රී ලංකා" යන වචන ආදේශ කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1966 අංක 37 දරන පනත සංශෝධනය කිරීම.

2—ඒ 24586—6,970 (76/12)